වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

2017

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

தேசிய தொழில்முயற்சி அபிவிருத்தி அதிகாரசபை

National Enterprise Development Authority

කර්මාන්ත කටයුතු අමාත්‍යාංශය

கைத்தொழில் அமைச்சு

Ministry of Industry





හැඳින්වීම

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2016 අංක 07 දරන පාර්ලිමේන්තු පනත යටතේ 2006 වර්ෂයේදී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට පහසුකම් සැපයීමට මෙම ආයතනය වෙත බලය පැවරී ඇත. දේශීය ව්‍යවසායකයන් හට යටිතල පහසුකම් මූල්‍ය හා ප්‍රතිපත්ති මට්ටමේ සහයෝගය ලබා දීම සඳහා අධිකාරී පනතේ නීති මගින් බලය පවරා ඇත.

රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් හා මග පෙන්වීම අනුව කළාපීය මට්ටමේ මෙන්ම ජාතික මට්ටමේ විවිධ ක්‍රියාකාරකම් සඳහා අධිකාරිය සම්බන්ධ වී ඇත. ආයෝජන ප්‍රවර්ධනය හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ යටතේ 2006 වර්ශයේ සිට 2010 වර්ශය දක්වා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ලැයිස්තුගත වී තිබුනි. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2010 වර්ශය සිට කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශය යටතට පත්වී මේ දක්වා කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශය යටතේ පාලනය වේ.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට ප්‍රාදේශිය ලේඛම් කොට්ඨාශ මට්ටමෙන් විවිධ වැඩසටහන් ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ආරම්භ කරන්නට යෙදුණි. එ ය රාජ්‍ය හා පුද්ගලික බැංකු, ව්‍යාපාරික මන් ඩල, රාජ්‍ය නොවන සංවිධාන (දේශීය හා විදේශීය) ආදී රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා සම්බන්ධ වී ඇත. මෙම වැඩසටහන් වල පරමාර්ථය වී ඇත්තේ බිම් මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට මූල්‍ය සහයෝගීතාවය, පුහුණු හා උපදේශක සහයෝගීතාවය වැනි මූලික අවශ්‍යතාවයන් සැපයීම වේ. ප්‍රාදේශිය ලේඛම් කාර් යාල මට්ටමෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සම් බන් ධීකරණය සඳහා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් ප්‍රාදේශිය ලේඛම් කාර් යාල වලට අනුයුක්ත කර ඇත.



දැක්ම

“ජාතියේ ආර්ථික, දේශපාලනික හා සමාජ අභිලාෂයන් සපුරාලීමෙහි ලා දායකත්වය සැපයිය හැකි තරඟකාරී ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයක් ශක්තිමත් හා තිරසාර අන්දමින් ගොඩනැංවීම”

මෙහෙවර

“ශ්‍රී ලංකා ජාතික ආර්ථිකයේ ප්‍රමුඛ අංගයක් වශයෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) යටතේ ඇති **ව්‍යවසායන්හි සංවර්ධනය, පැවැත්ම හා තරඟකාරීත්වය නැංවීම උදෙසා පහසුකම් සැපයීම හා සක්‍රිය අන්දමින් සහාය දැක්වීම”**

අරමුණු

- ✓ ශ්‍රී ලංකාව තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධනය දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ පහසුකම් සැපයීම මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනය, ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමට දිරි දීම.
- ✓ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි **(NEDA)** පනතේ පරමාර්ථයන් ඉටුකිරීමෙහි ලා විදේශීය වෙළඳපොළ අවශ්‍යතා සැපිරිය හැකි දේශීය ව්‍යවසායකයන්ට ශ්‍රී ලංකාවෙන් බැහැරව අන්තර්ජාතික මට්ටමින් ස්ථාපිත කොට පවත්වාගෙන යා හැකි ව්‍යවසායන් සැලසුම් කිරීම උදෙසා පෙළැඹවීම හා ඒ සඳහා දිරිගැන්වීම.
- ✓ කර්මාන්ත හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි වෙළඳ හා සංවර්ධන කටයුතු ඵලදායී අන්දමින් ප්‍රවර්ධනය කිරීමට සහ සහාය වීමට අවශ්‍ය වන්නා වූ ප්‍රතිපත්ති, සැළසුම් සහ සැළසුම්ගත ප්‍රවර්ධන දිරිදීමනා සම්පාදනය කිරීම.
- ✓ ව්‍යවසාය සංවර්ධනයේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් වශයෙන් තාක්ෂණික කුසලතා පරිපූර්ණ මානව ප්‍රාග්ධනයක් වශයෙන් ජනතාව සවිබල ගැන්වීම.
- ✓ සංවර්ධන අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ✓ ව්‍යවසාය සංවර්ධනයට සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වයට ප්‍රවේශය සඳහා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම.
- ✓ නිශ්පාදන සංවර්ධනය, තාක්ෂණික වැඩිදියුණු කිරීම් සහ පේටන්ට් බලපත්‍ර වාණිජකරණය සම්බන්ධයෙන් වන පර්යේෂණ හා සංවර්ධනය ඉහල නැංවීම සඳහා තාක්ෂණ සංවර්ධන අරමුදලක් පිහිටුවීම.
- ✓ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනයට පහසුකම් සැලසීම.

අධ්‍යක්ෂක මණ්ඩලය

1. ඕමාර් කාමිල් මයා - සභාපති / අධ්‍යක්ෂ ජනරාල්
2. එස්. බාලසුබ්‍රමනියම් මයා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික අතිරේක ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
3. එච්. ඒ. තාරකා එරන්දි මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහකාර අධ්‍යක්ෂ,රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව, මහාභාණ්ඩාගාරය
4. සංජීව දික්වැල්ල මයා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
5. එම්.එස්.මොහමඩ් නදීර් මයා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
6. එස්. ආනන්දරාසා මයා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
7. ඩී. කේ. බෝගොල්ලාගම මයා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2022 පෙබරවාරි 14

ගරු පාර්ලිමේන්තු **විමල් වීරවංශ** මහතා

කර්මාන්ත කටයුතු අමාත්‍ය

කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශය

අංක 73/1,

ගාලු පාර

කොළඹ 03

ගරු අමාත්‍යතුමනී,

වාර්ෂික වාර්තාව 2017

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වහන්තිය ප්‍රාකාර පහත සඳහන් ලියවිලි මේ සමග ඉදිරිපත් කරමි.

1. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2017 වර්ශය සඳහා වූ ප්‍රගති වාර්තාව
2. 2017 දෙසැම් බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, ආදායම් පිළිබඳ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය
3. **විගණකාධිපති වාර්ථාව**

ඔබේ අවංක,

සුනිල් ජයරත්න
සභාපති / අධ්‍යක්ෂ ජනරාල්

වාර්ෂික වාර්තාව **2017**

සංවර්ධන වැඩසටහන්

1.0 තොරතුරු බෙදාහැරීම

2.0 **ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය** (MSME)**තොරතුරු පද්ධතිය සකස් කිරීම**

3.0 **ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතනවල ධාරිතා වර්ධනය**

4.0 **ප්‍රාදේශීය ව්‍යවසායක සම්මාන ප්‍රදානෝත්සව**

5.0 **දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ව්‍යාපාර සමුළු**

6.0 **ගැටලු සෙවුම් යාන්ත්‍රණය**

7.0 **ගැනුම් විකුනුම් හමුව (පළාත් මට්ටමින්)**

8.0 **පර්ෂද සංවර්ධන වැඩසටහන - මොරටුව පර්ෂදය**

9.0 **ඇසුරුම්කරණ සහාය අවශ්‍ය ප්‍රාදේශීය ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම**

10.0 **ප්‍රාදේශීය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන**

11.0 **කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන**

12.0 ‘‘**උපාධිධාරී ව්‍යවසායක උදානය වැඩසටහන**’’

13.0 **විකාශන තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානය** (ITTC)

සංවර්ධන වැඩසටහන් - 2017

වැඩසටහන් අංක 01: ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අත්පොත සකස් කිරීම.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මෙන්ම ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන වෙනුවෙන් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අත්පොත ප්‍රකාශයට පත්කරන ලදි. අත්පොතෙහි යන්ත්‍රසූත්‍ර සැපයුම්කරුවන්, ව්‍යාපාර උපදේශන සේවා ආයතන, පුහුනුකරුවන් සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතනවල අනෙකුත් තොරතුරු ඇතුලත් වේ. සාර්ථක ව්‍යාපාරයක් ආරම්භ කිරීමෙහිලා එය ඔවුන්ට ඉතා ප්‍රයෝජනවත් ලේඛනයක් වේ. (පිටු 200ක පමණ)

වැඩසටහන් අංක 02: ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) **දත්ත පදනම සකස් කිරීම.**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දත්ත පදනම පවත්වාගෙන යනු ලබන අතර, එය වාර්ෂිකව යාවත්කාලීන කරනු ලබයි. ප්‍රාදේශීය මට්ටමින් සිය ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් පිළිබඳ තොරතුරු එහි ඇතුලත් වේ.

වැඩසටහන් අංක 03: ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතනවල ධාරිතා වර්ධනය

ව්‍යාපාර සහාය සේවා, උසස් තත්ත්වයේ පාරිභෝගික සේවා උපදෙස් ලබාදීම, මග පෙන්වීම, සහාය වීම සහ පුහුනුව ලබාදීම යනාදී සේවාවන් සැපයීම හරහා දේශීය ප්‍රජාව සමග කටයුතු කළයුතු අතර, එහිදී රැකියා විරහිත පිරිස් සඳහා පමණක් නොව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායක ප්‍රජාව වෙනුවෙන්ද එම සේවාවන් සැපයිය යුතුවේ. මෙකී සේවාවන්, තනි පුද්ගල උපදේශක සේවා මෙන්ම ව්‍යාපාර සංවර්ධන සේවා ආයතන(BDS) මගින්ද සපයනු ලැබේ. ව්‍යවසායකයින්ට සිය ව්‍යාපාර ආරම්භය, පුළුල් කිරීම, මූල්‍ය පහසුකම්, අධ්‍යාපනය හෝ පුහුනු මෙන්ම අනෙකුත් ව්‍යාපාර සහාය සේවා සම්බන්ධයෙන් සහයෝගය අවශ්‍ය වේ. එනමුත්, ව්‍යවසායකයින් සඳහා එවැනි සේවාවන් සැපයීමේ විධිමත් යාන්ත්‍රණයක් නොමැති අතර, ව්‍යවසායකයින් හා ව්‍යාපාර සේවා සපයන්නන් අතර විධිමත් සබඳතා ජාලයක් ද නොපවතී. ඊට අමතරව, සමහර ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතනවලට ගුණාත්මක සේවාවක් සැපයීමේ ධාරිතාව අඩු මට්ටමක පවතී. එබැවින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් එකී ආයතනවල හැකියාවන් වර්ධනය තුළින් ගුණාත්මක සේවාවක් සැපයීමේ මට්ටම වර්ධනය කිරීම සඳහා ඔවුන් වෙනුවෙන් ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ.

2017 වර්ෂයේදී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතනවල අවශ්‍යතා ඇගයීමක් සිදුකරන ලද අතර, එමගින් ඔවුන්ගේ අවශ්‍යතාවන් හඳුනාගන්නා ලදි. ඒ

මත පදනම්ව, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් 2018 වර්ෂයේ දී ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සඳහා ධාරිතා සංවර්ධන(මානව සම්පත් සංවර්ධන) වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

වැඩසටහන් අංක 04: ප්‍රාදේශීය මට්ටමින් ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව පැවැත්වීම

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ප්‍රශස්ත අන්දමින් දායකත්වය සපයා ඇති ව්‍යාපාර හඳුනා ගැනීම, ඇගයීම හා දිරිමත් කිරීම යන අරමුණෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව පවත්වනු ලබයි. දිස්ත්‍රික් කාර්යාල / රාජ්‍ය ආයතනවල සහයෝගීත්වයෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පළාත් නමය තුළ සම්මාන ප්‍රදානෝත්සව නමයක් පැවැත්වීමට කටයුතු කරන ලදි.

වැඩසටහන් අංක 05: දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස (ප්‍රා/ලේ) මට්ටමින් ව්‍යවසායකයින්ට ව්‍යාපාර සංවර්ධන සේවාවන් සැපයීමේ විධිමත් යාන්ත්‍රණයක් සැකසීමේ අරමුණෙන් දිස්ත්‍රික්/ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද පිහිටුවා ඇත. මෙකී සංසද දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන, වාණිජ මණ්ඩල සහ වෙළඳ හෝ ව්‍යාපාර සංගම්වලින් සමන්විත වේ. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද පිහිටුවීමට සැලසුම්කොට ඇත.

දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංසද (DEF) හා ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද (REF) අරමුණු:

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතන අතර සබඳතා ගොඩනැංවීම
- රාජ්‍ය හා පෞද්ගලික සංවාද සඳහා පහසුකම් සැපයීම
- දිස්ත්‍රික්/ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංගම් අතර මනා සම්බන්ධීකරණයක් ඇතිකිරීම
- දිස්ත්‍රික්/ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද හරහා ව්‍යවසායකයින්ට ව්‍යාපාර සංවර්ධන සේවා සැපයීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම
- ප්‍රාදේශීය මට්ටමේ සංසද මගින් ව්‍යාපාර ගැටලු රැස්කොට ඒවා ජාතික මට්ටමේ සංසදය වෙත යොමුකිරීම හා එකී ගැටලු සඳහා විසඳුම් සෙවීමට කටයුතු කිරීම

2017 වසර දක්වා, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද 173 ක් දීප ව්‍යාප්තව පිහිටුවා ඇති අතර, නියමිත පරිදි රැස්වීම් පවත්වනු ලැබේ. එමෙන්ම දිවයින පුරා දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංසද 13ක් ස්ථාපිත කොට ඇත.





ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද - අනුරාධපුර

වැඩසටහන් අංක 06: ගැටලු සෙවුම් මෘදුකාංගය

ගැටලු සෙවුම් මෘදුකාංගය යනු සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයේ පවත්නා ගැටලු සොයාගැනීමට භාවිතා කරන යෙදවුමකි. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් මෙම ගැටලු සෙවුම් පද්ධතිය ක්‍රියාකරවීම සඳහා පමණක් වෙන් වූ දෘඩාංගයක් (server) ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ස්ථාපිත කොට ඇත. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ගැටලු සෙවුම් මෘදුකාංගයේ ක්‍රියාකාරීත්වය මේ වනවිට වඩාත් කාර්යක්ෂම තත්ත්වයට පත්කොට ඇති අතර, නියමු ව්‍යාපෘතියක් වශයෙන් තෝරාගත් දිස්ත්‍රික්කවල නොවිසඳුනු ගැටලු මෙයට ඇතුලත් කරනු ලැබේ. (කළුතර, හම්බන්තොට සහ යාපනය දිස්ත්‍රික්ක)



යාපනය දැනුවත් කිරීම

වැඩසටහන් අංක 07: ගැනුම් විකුනුම් හමුව (පළාත් මට්ටම)

තිරසාර හා සමාන වූ ආර්ථික වර්ධනයකට ඵලදායී අන්දමින් දායකවීම උදෙසා ව්‍යවසායකයින් තුළ පවත්නා ශක්තීන් (ධාරිතාවයන්) සීමා කිරීමට අඛණ්ඩව බලපවත්නා සාධක කිහිපයකි. මෙවැනි සාධක බොහොමයක් හඳුනාගෙන ඇති අතර, ව්‍යවසායකත්ව දැනුම හා කුසලතා අඩුකම, ප්‍රාග්ධන හා යටිතල

පහසුකම් අවම වීම, වෙළඳපොළ අවස්ථා සීමිත වීම හා ප්‍රමාණවත් තාක්ෂණික දැනුම නොමැතිකම යනාදිය ඒ අතර වේ. එකී සාධක කේන්ද්‍රකර ගනිමින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සේවාවන් සපයනු ලබයි. 2017 වර්ෂයේ දී, ව්‍යවසායකයින් හා අදාළ ගැනුම්කරුවන් අතර සබඳතා ගොඩනැංවීම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ගැනුම් විකුනුම් හමු පැවැත්වීමට කටයුතු කරන ලද අතර, ඒවා පළාත් මට්ටමින් සංවිධානය කරන ලදි.

සංවර්ධන නිලධාරීන් මගින් ක්‍රියාවලිය හඳුනාගන්නා අතර, සංවර්ධන නිලධාරින් විසින් ලබාදෙන නිපැයුම්කරුවන්ගේ ලැයිස්තුවට අනුව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ගැනුම්කරුවන් හඳුනාගනු ලැබේ. මෙම වැඩසටහන යටතේ, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ගම්පහ සහ මහනුවර දිස්ත්‍රික්කවල පවත්වන ලද ගැනුම් විකුනුම් හමු තුළින් නිපැයුම්කරුවන් 200ක් ගැනුම්කරුවන් වෙත හඳුන්වා දෙන ලදි.

වැඩසටහන් අංක 08: පර්ෂද සංවර්ධන වැඩසටහන - මොරටුව පර්ෂදය

මොරටුව දැව භාණ්ඩ ව්‍යවසායකයින් ශක්තිමත් කිරීමේ වැඩසටහනට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය දායකත්වය සපයයි. මෙම ව්‍යවසායකයින්ට අළෙවි සංවර්ධන, ව්‍යවසායකත්ව සංවර්ධන, තාක්ෂණික හුවමාරුව සහ මූල්‍ය සහයෝගීතාවය යනාදී ක්ෂේත්‍රයන්හි සිය හැකියාවන් වර්ධනය කරගැනීමට සහාය වීම ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ අපේක්ෂාවයි. මොරටුව දැව භාණ්ඩ සංගම් මෙම වැඩසටහන සමග එක්ව සිටින අතර, ඔවුන් මෙම වැඩසටහන තුළින් කෙටි කාලීන හා දිගු කාලීන ප්‍රතිලාභ අපේක්ෂා කරයි.

2017 වර්ෂයේ දී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ව්‍යවසායකයින් (වඩුකාර්මික) 25 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනක් පවත්වන ලද අතර, මූල්‍යමය පහසුකම් සැපයීමට ද කටයුතු කරන ලදි.

වැඩසටහන් අංක 09: ඇසුරුම්කරණ සහාය අවශ්‍ය ප්‍රාදේශීය ව්‍යවසායකයින් සඳහා පහසුකම් සැපයීම



ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සැපයුම්කරුවන් වශයෙන් ස්ථාවරයක් ගොඩනගා ගැනීමට පහසුකම් සැලසීමේ අරමුණින් ඔවුන් සැපයුම්කරුවන් වශයෙන් සුපිරි වෙළඳසැල් ජාලය වෙත හඳුන්වා දෙනු ලබයි. ඒ අනුව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සංවර්ධන නිලධාරීන් මාර්ගයෙන් ඒ සඳහා හැකියාවක් සහිත

සැපයුම්කරුවන් හඳුනාගන්නා අතර, ඔවුන්ගේ නිශ්පාදනවල ගුණාත්මකභාවය සහ සැපයුම් ධාරිතාවය පිළිබඳ ඇගයීමක් සිදුකරනු ලබයි. එහිදී තාක්ෂණික පුහුනුව ලබාදීම මගින් නිශ්පාදනවල ගුණාත්මකභාවය ඉහල නැංවීම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සහාය ලබාදේ. 2017 වර්ෂයේදී දිස්ත්‍රික්ක තුනක (ගම්පහ, කළුතර, පුත්තලම පැවති ඉල්ලුම මත පදනම්ව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ව්‍යවසායකයින් 213 දෙනෙකු සඳහා තාක්ෂණික පුහුනුව ලබාදෙන ලදි.





ගම්පහ පුහුනු වැඩසටහන

වැඩසටහන් අංක 10: ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්

ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන භූමිකාවක් ප්‍රාදේශීය මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් ඉටුකරනු ලැබේ. එසේ වුව ද, ඔවුන්ගේ ව්‍යවසායකත්ව දැනුම, අළෙවිකරණ, තාක්ෂණික හා මූල්‍ය කළමනාකරණ දැනුම යනාදිය ප්‍රමාණවත් මට්ටමක නොමැති බව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් හඳුනා ගන්නා ලදි. එසේම, ඔවුන්ට තම ව්‍යාපාර ආරම්භ කිරීමට /පුළුල් කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුව ඇත. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන් ප්‍රාදේශීය මට්ටමින් සේවයේ නියුක්තව සිටින අතර, ඔවුන් විසින් ඉහත කී දැනුම හා කුසලතා වර්ධනය කරලීමට අවශ්‍ය ව්‍යවසායකයින් හඳුනාගනු ලැබේ.

එබැවින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සංවර්ධන නිලධාරීන්ගේ සහයෝගය ඇතිව සියලුම දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය මට්ටමේ ව්‍යවසායකයින් සඳහා කෙටි කාලීන පුහුනු වැඩසටහන් හා පසු විපරම් සේවා පවත්වනු ලැබේ. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මේ සම්බන්ධයෙන් සංවර්ධන නිලධාරීන්ගෙන් ව්‍යාපෘති යෝජනා භාරගනු ලැබේ.

2017 වර්ෂයේදී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ප්‍රාදේශීය මට්ටමේ ව්‍යවසායකයින් 7100ක් පුහුනු කරන ලදි.





කුරුණෑගල පුහුනු වැඩසටහන්

වැඩසටහන් අංක 11: කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්

ශ්‍රී ලාංකික කාන්තාව මේ වනවිට මෙරට ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී භූමිකාවක් නිරූපණය කරයි. එමෙන්ම ඔවුන් ව්‍යාපාරික ක්ෂේත්‍රයේ පුරුෂ පක්ෂය හා සම තත්ත්වයට පත්වීමේ තරහයක යෙදෙන තත්ත්වයක් ද පෙන්නුම් කරයි. එනමුත් සැලකිය යුතු කාන්තා ව්‍යවසායකයින් පිරිසක් තවමත් සාපේක්ෂව පසුගාමී තත්ත්වයක පසුවෙයි. කෙසේ වුව ද, මේ වනවිට තත්ත්වය වෙනස්වීමකට භාජනය වී ඇති අතර, මෙරට ආර්ථික ක්‍රියාදාමයට ශ්‍රී ලාංකික කාන්තාව විශිෂ්ට දායකත්වයක් ලබාදෙන බවට සාක්ෂි බොහොමයක් පවතී. පසුගිය දශක කිහිපයක කාලය තුළ විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ පිරිමි ව්‍යාවසායකයින් අභිබවමින් සැලකිය යුතු ප්‍රගතියක් ඔවුන් විසින් අත්පත් කරගෙන ඇත. කාන්තාවන් විශාල පිරිසක් තමාගේම ව්‍යාපාර ආරම්භ කරන ලද අතර, ඒ අතරින් බොහොමයක් සාර්ථකත්වයට පත්ව ඇත. එනමුත්, ව්‍යවසායකත්වය, අළෙවිකරණය, තාක්ෂණික සහ මූල්‍ය කළමනාකරණය යන ක්ෂේත්‍රයන් පිළිබඳ ඔවුන්ට ඇති දැනුම ප්‍රමාණවත් මට්ටමක නොපවතී. තව ද, ඔවුන් තම ව්‍යාපාර ආරම්භයට/ පුළුල් කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් නොමැති වීමේ බාධකයට මුහුන පා සිටී. එබැවින්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සංවර්ධන නිලධාරීන්ගේ සහයෝගය ඇතිව සියළුම දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය මට්ටමින් කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ.

2017 වර්ෂයේදී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ප්‍රාදේශීය මට්ටමේ කාන්තා ව්‍යවසායකයින් 6200ක් පුහුනුකොට ඇත.





කෑගල්ල පුහුනු වැඩසටහන්

වැඩසටහන් අංක 12: "උපාධිධාරී ව්‍යවසායක උදානය" වැඩසටහන

මෙරට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානයක් ලබාදෙමින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර සංවර්ධනය කිරීමෙහිලා ප්‍රවර්ධනය, සහාය දැක්වීම, දිරිමත් කිරීම හා පහසුකම් සැපයීම සිදුකරනු ලබයි. ඒ යටතේ ව්‍යවසායකයින්ට හා ව්‍යාපාර සංවර්ධන සේවා සපයන ආයතනවලට ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්, මූල්‍ය පහසුකම්, වෙළඳපොළ සබඳතා, පර්යේෂණ හා සංවර්ධනය සහ යටිතල පහසුකම් සංවර්ධනය යනාදී සේවාවන් සපයනු ලබයි.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විශ්ව විද්‍යාල සමග එක්ව උපාධිධාරීන් ව්‍යාපාර ක්ෂේත්‍රයට සම්බන්ධ කිරීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පවත්වනු ලබයි. උපාධිධාරීන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට ආකර්ශනය කරලීමේ මෙම වැඩසටහන **"උපාධිධාරී ව්‍යවසායක උදානය"** යනුවෙන් නම්කොට ඇත.

වැඩසටහන් අරමුණ: උපාධිධාරීන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට ප්‍රවිශ්ට වීම දිරිමත් කිරීම හා ඔවුන් සාර්ථක ව්‍යවසායකයින් බවට පත්කිරීම

ක්‍රියාත්මක කිරීම : ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය(NEDA) සහ විශ්ව විද්‍යාල CGU

ඉලක්කගත කණ්ඩායම: ව්‍යාපාරික ක්ෂේත්‍රයට ඇල්මක් දක්වන විශ්ව විද්‍යාලවල අවසන් වසරේ විද්‍යාර්ථීන්

වැඩසටහන මගින් සැපයෙන් පහසුකම්:

- ධාරිතා සංවර්ධන වැඩසටහන් (ව්‍යවසායකත්ව සංවර්ධන, ව්‍යාපාර කළමනාකරණය සහ අළෙවිකරණය යනාදී..)
- තාක්ෂණික හුවමාරුව (අවශ්‍යතා මත පදනම්ව)
- වෙළඳපොළ සබඳතා
- ව්‍යාපාර ආරම්භයට/පුළුල් කිරීමට මූල්‍ය පහසුකම්
- නිරීක්ෂණ සංචාර
- ව්‍යාපාර උපදේශන සේවා සහ පසු විපරම් සේවා

2017 වර්ෂයේදී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය උපාධිධාරීන් 186 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුනුව ලබාදී ඇති අතර, උපාධිධාරීන් 61 දෙනෙකු සඳහා ප්‍රතිපාදන ලබාදී ඇත.



රජරට විශ්වවිද්‍යාලය දැනුවත් කිරීමේ වැඩසටහන



මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙමින්

වැඩසටහන් අංක 13: විකාශන හා තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානය(ITTC)

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ සහයෝගය ඇතිව මාකඳුර විකාශන හා තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්‍රදේශයේ පවතින ක්ෂුද්‍ර මූල්‍ය හා කුඩා කර්මාන්ත සඳහා පහසුකම් සැපයීම හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය නිමකළ උපාධිධාරීන් ස්වඋත්සාහයෙන් නැගී සිටීමට හැකියාව ලබාගන්නා තෙක්, ඔවුන්ට නව ව්‍යාපාර ආරම්භනය සඳහා පහසුකම්කම් සැපයීමයි.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සහභාගීත්වයෙන් අගෝස්තු මස අගභාගයේදී මෙම මධ්‍යස්ථානය විවෘත කරන ලදි.



ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

	සටහන්	2017 රු.	2016 රු.
වැඩසටහන් සඳහා ලද ප්‍රතිපාදන භාවිතය			
වර්ෂය සඳහා සක්‍රිය වෙන්කිරීම්	16	37,631,641	31,614,270
වැඩසටහන් සඳහා වියදම්	9	37,631,641	31,614,270
වාර්ෂික වැඩසටහන්වල අතිරික්තය/(හිඟය)		-	-
මෙහෙයුම්			
මහ භාණ්ඩාගාර පුනරාවර්තන වෙන්කිරීම්		19,609,491	19,202,159
රාජ්‍ය ප්‍රතිපාදන මගින් ක්‍රමක්ෂය සඳහා වෙන්කිරීම්	14	3,074,050	5,631,434
වෙනත් ආදායම්	7	28,287,093	18,548,872
ආදායම් එකතුව		**50,970,633**	**43,382,465**
පරිපාලන වියදම්	8	23,536,262	25,333,872
වෙනත් ව්‍යාපෘති සඳහා වියදම්	9	62,026	44,000
වියදම් එකතුව		**23,598,288**	**25,377,872**
වාර්ෂික වැඩසටහන්වල අතිරික්තය		**27,372,346**	**18,004,593**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන්	2017 රු.	2016 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	10	10,097,481	11,988,452
ජංගම වත්කම්			
ලැබීම්	11	322,395	-
තැන්පතු හා අත්තිකාරම්	12	115,835,183	30,890,400
පෙරගෙවුම් වියදම්	13	63,916	83,187
උත්සව අත්තිකාරම්		10,250	10,000
ආපදා ණය		2,039,356	
මුදල් හා මුදල් සමානතා		2,308,452	18,498,850
ජංගම වත්කම් එකතුව		**120,579,552**	**49,482,436**
සී/ස බී එක්ස්ප්‍රස් සමාගම		**46,432,687**	**18,387,668**
ඉතිරිකිරීමේ ගිණුම් - පාරිතෝෂික		**521,567**	**521,567**
වෙනත් ජංගම වත්කම් එකතුව		**46,954,254**	**18,909,235**
වත්කම් එකතුව		**117,631,289**	**80,380,125**
හිමිකම් සහ වගකීම්			
හිමිකම්			
සමුච්චිත අතිරික්තය		26,303,316	18,564,910
හිමිකම් එකතුව		**26,303,316**	**18,564,910**
ජංගම නොවන වගකීම්			
රාජ්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම්	14	7,334,163	9,225,134
විශ්‍රාම ප්‍රතිලාභ	15	890,419	521,567
ජංගම නොවන වගකීම් එකතුව		**8,224,582**	**9,746,701**
ජංගම වගකීම්			
වැඩසටහන් සඳහා වෙන්කිරීම්	16	139,358,986	34,650,594
උපචිත වියදම්	17	527,093	1,479,581
කොන්ත්‍රාත් වගකීම්	18		4,326,007

අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය	19	17,313	11,612,332
M/s.GIZ	20	3,200,000	
ජංගම වගකීම් එකතුව		**143,103,392**	**52,068,514**
හිමිකම් හා වගකීම් එකතුව		**177,631,289**	**80,380,125**

පිටු අංක 05සිට 18 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ අනිවාර්ය අංගයකි

අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත සමඟ ඒකඟ වන බවට මම සහතික කරමි.

ගණකාධිකාරී

අත්සන් කලේ,

අනුෂ්ක ගුණසිංහ

සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

.....	.....
අසංක විජේසුන්දර	ඒ.හේමසිර පෙරේරා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } වීඒසී/බී/එන්ඊඩීඒ/එෆ්ඒ/ 2017 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2021 දෙසැම්බර් 02 දින

සභාපති,

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 20(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් අධිකාරිය සම්බන්ධ ගණුදෙනු පිළිබඳ වාර්තාව 2020 ජූලි 24 දින භාෂාත්‍රයෙන් යුතුව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්කර්ෂතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. කෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුභාවී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහෝමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 අභිනකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

(අ) ශ්‍රී. ලං. ගි. ප්‍ර. 01 :- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ප්‍රමිතය ප්‍රකාරව, ශ්‍රී.ලං.ගි.ප්‍ර 08 හි දැක්වෙන පරිදි අතීතානුයෝගී නැවත ප්‍රකාශ කිරීමට අනුව වන බලපෑම හඳුනාගැනීමට අදාල වන ස්කන්ධයේ සෑම සංරචකයක්ම දක්වමින් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, සමාලොචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ පෙර වර්ෂ වලට අදාලව සිදු කරන ලද ගැලපීම් වල ශුද්ධ වෙනස පමණක් ගැලපීම් කර ඉදිරිපත් කර තිබුණි.

(ආ) ශ්‍රී. ලං. ගි. ප්‍ර. 16 :- දේපල පිරියත හා උපකරණ

(i) වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂා තත්ත්වයන් ඉහත දී කළ ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම LKAS 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 2017 දෙසැම්බර් 31 දිනට ලියාභල අගය රු. 10,097,481 ක් වූ යන්ත්‍රෝපකරණ , මෝටර් රථ, කාර්යාල උපකරණ, ලීබඩු හා සවිකිරීම්, පුස්තකාල පොත්, ගිණුම් මෘදුකාංග සහ පරිගණක හා පරිගණක උපාංග වල අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි.

(ii) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් තවදුරටත් භාවිතයට ගනු ලබන මෝටර් රථ 01ක්, කාර්යාල උපකරණ 24 ක් සහ පරිගණක සහ උපාංග 49 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i)එවකට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් අධිකාරියට ලබා දුන් රු. 46,450,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු.46,432,687 ක් වැයකර සමාලෝචිත වර්ෂය තුළදී මාකඳුර කර්මාන්ත පුරයේ පෙරවැඩුම් හා කාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. එම මධ්‍යස්ථානය සීමා සහිත සමාගමක් වශයෙන් ලියාපදිංචි කර තිබුණු අතර සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 60 ක දායකත්වයක් අධිකාරිය වෙත හිමි වී තිබුණි. ඉහත ප්‍රතිපාදනයෙන් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වැය කරන ලද රු.46,432,687 ක මුදල අධිකාරිය විසින් ඉහත සඳහන් සමාගමෙහි කරන ලද ආයෝජනයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද, එම වටිනාකමට සමාන කොටස් ප්‍රමාණයක් සමාගම විසින් අධිකාරිය වෙත නිකුත් කර නොතිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ඉහත සඳහන් පරිපාලිත සමාගමේ කොරතුරු ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත් ඉහත සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු බැවින් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ආ) පෙර වර්ෂවලට අදාලව පියවන ලද අත්තිකාරම් වටිනාකම වූ රු.19,633,940 ක් වැඩ සටහන් සඳහා වූ ප්‍රදාන ගිණුමට ගැලපීම වෙනුවට සමුච්චිත අතිරික්තයට ගැලපීම හේතුවෙන් සමුච්චිත අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද වැඩ සටහන් සඳහා වූ ප්‍රදාන ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු වටිනාකම රු.92,620 ක් වුව ද, එය රු.63,916 ක් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රක්ෂණ වියදම රු.28,704 ක් වැඩියෙන්ද ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පරිගණක හා උපාංගවල ක්ෂය වටිනාකම රු.445,042 ක් වුව ද, එය රු. 290,823 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම රු.154, 219 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) කුලී ගෙවනැගිල්ලක පවත්වාගෙන යනු ලැබූ අධිකාරියේ කාර්යාල පරිශ්‍රයේ සිදුකරන ලද නඩත්තු හා අළුත්වැඩියාවන් සඳහා 2014 වර්ෂයේ හා 2016 වර්ෂයේ දරන ලද පිළිවෙලින් රු.1,280,282 ක් හා රු. 56,250 ක් වූ වියදම් නඩත්තු වියදම් ලෙස ගිණුම්ගත නොකර යන්ත්‍ර සූත්‍ර ලෙස ප්‍රාග්ධනීත කර තිබුණු අතර ඊට අදාලව රු 590,892 ක් ක්ෂය වෙන් කර තිබුණි. එම නිසා වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් වල ධාරණ අගය රු. 745,640 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ විගණනය මගින් පිළියෙල කල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

විස්තරය	අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව	විගණනය මගින් පිළියෙල කල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව	වෙනස
මෙහෙයුම් ක්‍රියාකාරකම්	28,288,562	(112,503,769)	(140,792,331)
ආයෝජන ක්‍රියකාරකම්	(47,615,766)	(29,228,098)	18,387,668
මූල්‍ය ක්‍රියාකාරකම්	3,136,805	125,541,469	122,404,664

(ii) වර්ෂය සඳහා වූ ගැලපීම් රු. 19,633,940 ක් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අතිරික්තයට ගලපා නොතිබුණි.

(iii) වෙනත් ආදායම් තුළ ඇතුළත් විලම්භීත බැරකම් රු. 28,045,019 ක් මෙහෙයුම් අතිරික්තයට ගලපා නොතිබුණි.

(iv) වැඩසටහන් සඳහා ලද මූල්‍යමය ප්‍රදාන මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වනු වෙනුවට කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දක්වා තිබුණි.

(v) කොන්ත්‍රාත් සඳහා වන වගකීම අඩුවීම රු. 4,326,007ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.15,921,026 ක් ලෙස සටහන්කර තිබුණි..

(vi) සී/ස බී - එක්ස්ප්‍රස් සමාගමේ සමාලෝචිත වර්ෂය තුළ සිදුකළ ආයෝජන සහ පෙර වර්ෂයේ සිදුකළ ආයෝජන අතර වෙනස රු.28,045,019 ක් වුව ද, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.46,432,687 ක් ලෙස දක්වා තිබුණි.

(vii) සමාලෝචිත වර්ෂය තුළ ලද මුළු ප්‍රදාන වටිනාකම රු. 163,173,110 ක් වන ප්‍රදාන උපයෝජනය කිරීම රු.37,631,641 වුව ද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ රජයේ ප්‍රදාන ලැබීම් වශයෙන් රු.3,136,805 ක් පමණක් සටහන් කර තිබුණි.

2.2.3 නොසැසඳුනු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ එක් එක් මාසය අවසානයට පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයන් මුදල් පොතේ ශේෂය සමග සැසඳී නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු. 27,372,346 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 18,004,593ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,367,753 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ වූ ව්‍යාපෘතියක් වෙනුවෙන් ලද ප්‍රදානයෙන් ආදායමට ලියා හල අගය ඉකුත්

වර්ෂයට සාපේක්ෂව රු. 9,657,351 කින් වැඩිවීම ඉහත අතිරික්තය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2020 දෙසැම්බර් 21 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

3.3 ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම

ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඩබ්ලිව්. පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති